# ආපාථගත යන පදයේ අර්ථය

489. රූපං චක්ඛුපසාදම්හි, ඝට්ටිත්වා තඞ්ඛණෙ පන;
මනොද්වාරෙ තථාපාථ-මාගච්ඡති නිසංසයො.

490. ඛගො යථා හි රුක්ඛග්ගෙ, නිලීයන්තොව සාඛිනො;
සාඛං ඝට්ටෙති තස්සීධ, ඡායා ඵරති භූමියං.

491. සාඛාය ඝට්ටනච්ඡායා, ඵරණානි ච සබ්බසො;
අපුබ්බාචරිමං එක-ක්ඛණස්මිංයෙව ජායරෙ.

492. එවමෙව ච රූපස්ස, පසාදස්ස ච ඝට්ටනං;
භවඞ්ගචලනස්සාපි, පච්චයත්තෙන අත්ථතො.

493. තථෙව ච මනොද්වාරෙ, ආපාථගමනම්පි ච;
අපුබ්බාචරිමං එක-ක්ඛණස්මිංයෙව හොතිති. (අභිධම්මාවතාර)

492-3.රූපස්සාති සම්බන්ධෙ සාමිවචනං, තස්ස පන ඝට්ටනං, ආපාථගමනම්පි චාති ද්වීහි සහ සම්බන්ධො. පසාදස්සාති කම්මත්ථෙ සාමිවචනං, අත්ථතො ආපාථගමනම්පි චාති සම්බන්ධො. ආරම්මණවසෙන, ආපාථං ආගච්ඡන්තස්සපි පසාදඝට්ටනෙන ච භවඞ්ගචලනස්ස පච්චයභාවෙන ආපාථං විය උපගමනන්ති අත්ථො. (අභිධම්මාවතාර පුරාණටීකා)

- ❖ එකචිත්තක්ඛණාතීතානි වා බහුචිත්තක්ඛණාතීතානි වා ඨිතිප්පත්තානෙව පඤ්චාරම්මණානි පඤ්චද්වාරෙ ආපාතමාගච්ඡන්ති. **(අභිධම්මත්ථසංගහ)**

**ආපාථමාගච්ඡන්ති** - ආපාතං - ඉදිරියට පැමිණේ (ශබ්දාර්ථය); නොහොත් - ප්‍රකට බවට; ආගච්ඡන්ති - පැමිණෙත්. මෙහි 'ඉදිරියට පැමිණේ' යන්නෙන් 'සමීපයට පැමිණේ" යන්න අදහස් නොකෙරේ. සමීපයට හෝ වේවා දැකීමට නොකහැකි තරම් දුරස්ථ හෝ වේවා අදාළ ද්වාරයන් සමග සම්බන්ධ වීම 'ඉදිරියට පැමිණේ' යන්නෙන් අදහස් වේ. එසේ සම්බන්ධ වීම ම අදාළ ද්වාරයෙහි ප්‍රකට බවට පත් වීම යි.

**ආපාථ ගමනය සම්බන්ධයෙන් අටුවා ටීකාවල ඇති දක්වන ආකාර දෙක.**

1. ඒ ඒ ද්වාරයෙහි ප්‍රකට නොවී ප්‍රකට වීමට තරම් ආසන්නයට පැමිණීම
උදා - තස්මිං පන ආපාතමාගච්ඡන්තෙපි ආලොකසන්නිස්සයෙ අසති නුප්පජ්ජති (අත්ථසාලිනී - කාමාවචර විපාක පද විවරණය). (තස්මිං - ඒ රූපාරම්මණය; ආපාතං - ඉදිරියට; ආගච්ඡන්තෙපි - පැමිණියේ නමුදු; ආලොකසන්නිස්සයෙ - අලෝක සන්නිස්සය; අසති - නොමැති කල්හි; නුප්පජ්ජති - නූපදියි).

   මෙම පාඨයෙන් ආලෝකය නොමැති අවස්ථාවක දී සමීපයෙහි ඇති රූපාරම්මණය "ආපාතමාගච්ඡන්තෙපි" යනුවෙන් දක්වයි. එබැවින් මෙය 'ප්‍රකට වීම' යන අධිප්‍රාය අර්ථය නොදක්වා 'ඉදිරියට (පැමිණීම)' යන ශබ්දාර්ථය දැක්විය යුතු වේ.

2. ඒ ඒ ද්වාරයට ප්‍රකට වීමට තරම් ආසන්නයට පැමිණ ඒ ඒ චිත්තයන්ගේ ආරම්මණයන් වීමට තරම්, නැතහොත් භවාංග චලනය සිදු කිරීමට තරම් වන පැහැසීම 'ආපාථගමන' නම් වේ.
උදා - එකෙකමාරමණං ද්විසු ද්විසු ද්වාරෙසු ආපාතමාගච්ඡති (අත්ථසාලිනී). ආපාථමාගච්ඡති මනසා පඤ්චවිඤ්ඤාණෙහි ච ගහෙතබ්බභාවූපගමනෙන (මූලටීකාව). ගහෙතබ්බභාවූපගමනෙන, න ආපාතගමනමත්තෙන (මධුටීකාව).

   අටුවා ටීකා අතරින් "ආපාථමාගච්ඡති" යන අටුවා පාඨයේ "ආපාත" සඳහා සමීපයට පැමිණීම් මාත්‍රය ම පමණක් ගනීවි යන බියෙන් ටීකාවේ දී එය "මනසා පඤ්චවිඤ්ඤාණෙහි ච ගහෙතබ්බභාවූපගමනෙන" යනුවෙන් දැක්වේ. ඒ අනුව මනෝ විඤ්ඤාණය සහ පඤ්ච විඤ්ඤාණයන්ට අරමුණු කිරීමට තරම් සුදුසු පරිදි ප්‍රකට වීම "ආපාථගමන" යනුවෙන් අදහස් වේ. දෙවන ආකාරයේ ආපාථගමනයක් මෙයින් අදහස් වේ.